තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
தகவல் தொழிநுட்ப முகாமைத்துவ திணைக்களம்
Department of Information Technology Management

ITMD
ENRICHING DIGITAL ECONOMY



කාර්යසාධන වාර්තාව
செயலாற்றுத்திறன் அறிக்கை
Performance Report
2024



මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
Ministry of Finance, Planning and Economic Development

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

2024

ITMD
ENRICHING DIGITAL ECONOMY



කාර්යසාධන වාර්තාව



© 2024 තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මහලේකම් කාර්යාලය
කොළඹ 01
ශ්‍රී ලංකාව

dgitm@itmd.treasury.gov.lk
https://www.itmd.treasury.gov.lk

වාර්ෂික කාර්යසාධන වාර්තාව 2024

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
ශීර්ෂ අංකය 329

01 **01 පරිච්ඡේදය**
ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

02 **02 පරිච්ඡේදය**
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 **03 පරිච්ඡේදය**
වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

04 **04 පරිච්ඡේදය**
කාර්යසාධන දර්ශක

05 **05 පරිච්ඡේදය**
තිරසාර සංවර්ධන අරමුණු (SGD) සපුරා ගැනීමේ කාර්යසාධනය

06 **06 පරිච්ඡේදය**
මානව සම්පත් පැතිකඩ

07 **07 පරිච්ඡේදය**
අනුකූලතා වාර්තාව

ITAD
ENRICHING DIGITAL ECONOMY



කෙටි යෙදුම්

AD - Assistant Director
ADG - Additional Director General
AO - Administrative Officer
CGO - Comptroller General Office
CMIS - Cadre Management Information System
CoPA - Committee on Public Accounts
DC - Data Center
DD - Deputy Director
DFD - Department of Development Finance
DMA - Department of Management Audit
DO - Development Officer
DR - Disaster Recovery
eGP - e Government Payroll
FPD - Department of Fiscal Policy
GFLSMS - Guarantee Fund Loan Settlement System
Gov. Audit- Government Audit
ICTA - Information and Communication Technology Assistan/ Information and Communication Technology Agency
ICTO - Information and Communication Technology Officer
IOT - Internet of Think
IRP - Incident Response Plan
IT - Information Technology
ITMD - Department of Information Technology Management
ITMIS - Integrated Treasury Management Information System
LAD - Department of Legal Affairs
LGN - Local Government Network
MoF - Ministry of Finance
MSD - Department of Management Services
MSO - Management Service Officer
NBD - Department of National Budget
NFAMS - Non-Financial Asset Management System
NIC - National Identity Card
NOC - Network Operations Center
NPD - Department of National Planning
OES - Office Employee Service
PC - Personal Computer
PED - Department of Public Enterprises
PFD - Department of Public Finance
PFM - Public Financial Management
PMMD - Department of Project Management and Monitoring
POC - Proof of Concept
PP&E - Property, Plant and Equipment
SAD - Department of State Accounts
SLCERT - Sri Lanka Computer Emergency Readiness Team
SOEs - State Owned Enterprises
SRS - Software Requirements Specification
TIPD - Department of Trade and Investment Policy
TOD - Department of Treasury Operation
UAT - User Acceptance Testing

ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

ආර්ථික වර්ධනය, නවෝත්පාදන සහ ගෝලීය තරඟකාරිත්වය මෙහෙයවීම හරහා විවිධ අංශ වෙත තාක්ෂණය ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකාව ඩිජිටල් ආර්ථිකයක් වෙත ගමන් කරමින් සිටියි. යටිතල පහසුකම්, ඉ-වාණිජ්‍යය, මූල්‍ය තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණ සේවාවන් වැඩි දියුණු කිරීම සඳහා රජය, පෞද්ගලික අංශය සහ ජාත්‍යන්තර සංවිධාන එක්ව කටයුතු කරයි. ජාතික ඩිජිටල් ආර්ථික උපායමාර්ගයට අනුකූල වෙමින් සැමට ඩිජිටල් අවස්ථාවන් සඳහා ප්‍රවේශය සහිත ප්‍රමුඛ පෙළේ ඩිජිටල් රාජ්‍යයක් බවට පත්වීමට ශ්‍රී ලංකාව අපේක්ෂා කරයි.

2024 වර්ෂයේදී, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව (ITMD) සමෘද්ධිමත් ඩිජිටල් ආර්ථිකයක් දෙසට ගමන් කිරීමේ ගමනට උපකාරී වන පියවර කිහිපයක් ගෙන ඇත.

- මහා භාණ්ඩාගාරයේ දෙපාර්තමේන්තු කිහිපයක් සඳහා පද්ධති සංවර්ධනය ඇතුළුව, මුදල් අමාත්‍යාංශයට අයත් ආයතනවල ඇතැම් ක්‍රියාවලි ඩිජිටල්කරණය කිරීම මඟින් අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ලබා දෙන සේවාවන්හි විනිවිදභාවය සහ ඵලදායීතාවය ඉහළ නැංවීම
- අදාළ රාජ්‍ය ආයතන සම්බන්ධීකරණය කිරීම සහ පද්ධති සංවර්ධනය, ඒකාබද්ධ කිරීම සහ දත්ත හුවමාරු කිරීම සඳහා මාර්ගෝපදේශ සැපයීම
- රාජ්‍ය ආයතන, සංවර්ධකයින්, පුරවැසියන් සහ සැපයුම්කරුවන්ගෙන් සමන්විත ඩිජිටල්කරණ පරිසරය ශක්තිමත් කිරීම
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය මඟින් මහා භාණ්ඩාගාරය වෙත අඛණ්ඩව තොරතුරු තාක්ෂණ සේවා ලබා දීම

ඩිජිටල්කරණය වූ ආර්ථිකයක් කරා යන මාවතක් සඳහා සහය වීමට භාණ්ඩාගාරය සඳහා ශක්තිමත් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සැපයීමට කැපවී සිටින අතරම, තීරණාත්මක ජාල පද්ධති අඛණ්ඩව නිරීක්ෂණය කිරීමටත්, සේවා ස්ථාන සහයෝගීතා පොදු වේදිකාවක් වැඩි දියුණු කිරීමටත්, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

1.2. ආයතනයේ දැක්ම. මෙහෙවර, අරමුණු

❖ දැක්ම

රටේ ආර්ථික සංවර්ධනය උදෙසා ඩිජිටල්කරණය කළ හාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම.

❖ මෙහෙවර

භාණ්ඩාගාර කටයුතු නිසි කලට වේලාවට සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය සහ ඇගයීම පිණිස තීරණ ගැනීමට සහය වීම උදෙසා භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ඩිජිටල්කරණයට අවශ්‍ය පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය.


❖ අරමුණු

- ඉ-රාජ්‍ය සංකල්පය සාක්ෂාත් කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ කටයුතු සම්බන්ධීකරණය කිරීම
- කඩදාසි භාවිතයෙන් තොර කාර්යාල පරිසරයක් නිර්මාණය සඳහා ඵලදායී ඩිජිටල් සන්නිවේදන ප්‍රවේශයකට අවතීර්ණ වීම
- කාර්යක්ෂම සේවාවන් සැපයීම සඳහා අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික පද්ධති සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම හා පද්ධති සංවර්ධනය කිරීම
- මහා භාණ්ඩාගාරයේ තොරතුරු තාක්ෂණ පද්ධති මඟින් බාධාවකින් තොරව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ලබා දීම සහතික කිරීම සඳහා මූලික යටිතල පහසුකම් නවීකරණය කිරීම
- අමාත්‍යාංශයේ වෙබ් ද්වාරය සහ වෙනත් තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්‍රම හරහා පුරවැසියන්ට අවශ්‍ය තොරතුරු බෙදා හැරීමට සහතික කිරීම

1.3 ප්‍රධාන කාර්යයන්

- විවිධ ආයතනවල ඩිජිටල්කරණ වැඩසටහන් සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් සහය වීම
- මුදල් අමාත්‍යාංශයට සහ එහි දෙපාර්තමේන්තු සඳහා සම්මත තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයන් පිළිබඳ කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීමට කටයුතු කිරීම
- ක්‍රියාවලිවල නිසි ක්‍රියාකාරිත්වයට පහසුකම් සැලසීම සඳහා තොරතුරු තාක්ෂණ පද්ධති සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම
- ජාතික මට්ටමේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික මූලපිරීම් සඳහා පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධ වීම සහ ව්‍යාපෘති ජීවන චක්‍රය පුරාවට අවශ්‍ය පහසුකම් සැලසීම
- සයිබර් ආරක්ෂාව සහතික කිරීම
- භාණ්ඩාගාර වෙබ් අඩවිය ඔස්සේ යාවත්කාලීන කළ තොරතුරු සැපයීම
- නියමිත කාලවලදී තොරතුරු සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් දියුණු කිරීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණික සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කිරීමට අවශ්‍ය නඩත්තු කටයුතු සිදු කිරීම
- තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත තාක්ෂණික පුහුණු අවස්ථා ලබා දීම

1.4 සංවිධාන සටහන



ADG	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
DD	නියෝජ්‍ය අධ්‍යක්ෂ
AD	සහකාර අධ්‍යක්ෂ
AO	පරිපාලන නිලධාරී
ICTO	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
DO	සංවර්ධන නිලධාරී
ICTA	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
MSO	කළමනාකරණ සේවා නිලධාරී
OES	කාර්යාල සේවක සේවය

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ



1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල් - නැත

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේනම්) - අදාල නැත

ප්‍රගතිය සහ අනාගත දැක්ම

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය/මහා භාණ්ඩාගාරයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කළමනාකරණය කරන අතරම, ආර්ථික ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී රජයට සහය වීම සඳහා භාණ්ඩාගාර කළමනාකරණ ඩිජිටල්කරණය සම්බන්ධීකරණයට පහසුකම් සැපයීම පිළිබඳව ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරයි.

2.1 2024 වර්ෂයේදී ලබාගත් විශේෂ ජයග්‍රහණ

2.1.1 ප්‍රතිපත්ති හා සංවර්ධන අංශය

❖ **රාජ්‍ය ආයතනවල තොරතුරු පද්ධති ඒකාබද්ධ කිරීම සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය**

රාජ්‍ය ආදායම එක් රැස් කිරීමට අදාළව වැදගත් වන ආයතන 13 ක තොරතුරු තාක්ෂණ පද්ධති වැඩි දියුණු කිරීම හා ඒකාබද්ධ කිරීම තුලින් රාජ්‍ය ආදායම එකතු කිරීම කාර්යක්ෂම කිරීමට රාජ්‍ය ගිණුම් කාරක සභාව (CoPA) විසින් ලබා දෙන ලද උපදෙස් පරිදි, එම තොරතුරු තාක්ෂණ පද්ධති ඒකාබද්ධ කිරීමේ හැකියාව සොයා බැලීම හා ප්‍රගතිය වාර්තා කිරීමේ කාර්යය තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබිණි. ඒ සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡා සහ වැඩමුළු කිහිපයක් පවත්වන ලද අතර එහිදී එක් එක් ආයතනයේ තොරතුරු තාක්ෂණ පද්ධතිවල වත්මන් තත්ත්වය සහ එකී පද්ධති, අනෙකුත් ආයතනවල පවතින තොරතුරු තාක්ෂණ පද්ධති සමඟ ඒකාබද්ධ කිරීමේ අවශ්‍යතා හඳුනා ගන්නා ලදී. මෙම අවශ්‍යතා මත පදනම්ව, තොරතුරු තාක්ෂණ පද්ධතීන් ඒකාබද්ධ කිරීමේ ශක්‍යතාවය, තොරතුරු තාක්ෂණ පද්ධති ඒකාබද්ධ කිරීම සඳහා කෙටි හා දිගු කාලීන ප්‍රවේශයන් පිළිබඳ නිර්දේශ සහ පද්ධති ඒකාබද්ධ කිරීමේ කාර්යය සඳහා යෝජිත කාලසීමා ඇතුලත් වාර්තාවක් 2024 ජූලි මස 05 වන දින ඉදිරිපත් කරන ලදී.





මෙම දෙපාර්තමේන්තුව විසින් අදාල ආයතන 13හි පද්ධති ඒකාබද්ධ කිරීමේ කාර්යයන්ගේ ප්‍රගතිය අඛණ්ඩව පරීක්ෂා කරනු ලබන අතර, කාර්තුමය වශයෙන් ප්‍රගති වාර්තා ලබා ගැනේ. 2024 වර්ෂයට අදාළ ප්‍රගති සමාලෝචනය සම්බන්ධයෙන් ආසන්නතම රැස්වීම 2025 ජනවාරි මාසයේදී භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ප්‍රධානත්වයෙන් ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශයේ ලේකම්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්, තාක්ෂණික කමිටු සාමාජිකයන් සහ අදාළ සම්බන්ධීකරණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි.

❖ තොරතුරු තාක්ෂණ කළමනාකරණ චක්‍රලේඛ 01/2024 නිකුත් කිරීම

රජයේ තොරතුරු තාක්ෂණ පද්ධති ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියේදී, තොරතුරු පද්ධති තුළ පුද්ගලයන් (ශ්‍රී ලාංකික/විදේශීය) සහ ආයතන හඳුනා ගැනීම සඳහා අනන්‍ය හඳුනාගැනීමේ ක්‍රමවේදයක් භාවිතා නොකිරීම එම කාර්යයට බාධාවක් බව හඳුනා ගනු ලැබිණි.

ඒ අනුව, රාජ්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා රජයේ තොරතුරු තාක්ෂණ පද්ධතිවලට ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ අනන්‍යතාවය හඳුනා ගැනීම සඳහා ජාතික හැඳුනුම්පත් අංකයද, විදේශීය පුරවැසියන්ගේ අනන්‍යතාවය හඳුනා ගැනීම සඳහා විදේශ ගමන් බලපත්‍ර අංකය සමඟ ජාතිකත්වයද, ආයතනයක් හඳුනා ගැනීම සඳහා ව්‍යාපාර ලියාපදිංචි අංකය හා එම ආයතනවල හිමිකරුවන්ගේ/අධ්‍යක්ෂ මණ්ඩලවල දේශීය සාමාජිකයන්ගේ ජාතික හැඳුනුම්පත් අංකයද, විදේශීය සාමාජිකයන්ගේ විදේශ ගමන් බලපත්‍ර අංකයද, ඇතුලත් කිරීම අනිවාර්යය කිරීම සඳහා 2024 අගෝස්තු 26 දිනැතිව තොරතුරු තාක්ෂණ කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2024 නිකුත් කරන ලදී.

Govt. mandates NIC and Passport numbers for public IT systems

Wednesday, 28 August 2024 00:30


- {{hitsCtrl.values.hits}}

The Government has directed Heads of key State Departments to update its Information Technology (IT) system to boost efficiency and quality of public services.

The move comes following a Cabinet decision on 5 August, which involves mandatory



https://www.ft.lk/news/Govt-mandates-NIC-and-Passport-numbers-for-public-IT-systems/56-766056



මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාල / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல / My No: ITM/03/04/08
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.08.26


තොරතුරු තාක්ෂණ කළමනාකරණ චක්‍රලේඛ අංක : 01/2024

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, රාජ්‍ය බැංකු, විශ්ව විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනවල
ප්‍රධානීන් හා රජය සතු සමාගම්වල සභාපතිවරුන්

රාජ්‍ය සේවාවන්හි කාර්යක්ෂමතාවය හා ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා රජයේ
තොරතුරු තාක්ෂණ පද්ධතිවලට අදාළ පරිදි ජාතික හැඳුනුම්පත් අංකය / විදේශ ගමන්
බලපත්‍ර අංකය / සමාගම් ලියාපදිංචි අංකය ඇතුලත් කිරීම අනිවාර්ය කිරීම

https://www.treasury.gov.lk/web/information-technology-management-circular

❖ Guarantee Fund Loan Settlement System (GFLSMS)



භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ (TOD) ඉල්ලීම මත සංවර්ධනය කරන ලද මෙම පද්ධතිය මගින් රජයේ ආයතන, රාජ්‍ය බැංකු සහ රජයේ නිලධාරීන්ගේ පවුල් සඳහා ඇපකර අරමුදල මගින් දේපල ණය ගෙවීම් අයදුම්පත් නිරීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම පහසු කරයි. තවද, මෙම පද්ධතිය මඟින් ඇපක අරමුදල මගින් ණය පියවීම විනිවිදභාවයකින් යුක්තව අධීක්ෂණය සහ එම ක්‍රියාවලියේ කාර්යසාධන මට්ටම වැඩිදියුණු කිරීමේ අරමුණින් සකසා ඇත. එසේම, අතිරික්ත ලේඛන ක්‍රියාවලි මෙමගින් අවම කරන අතර සැකසීම් ප්‍රමාද අවම කරමින්, ණය පියවීමේ දත්ත වෙත වඩාත් පහසුවෙන් ප්‍රවේශ වීමේ හැකියාව ලබා දෙමින්, බලධාරීන් සහ සෙසු පාර්ශ්වකරුවන් සඳහා යාවත්කාලීන තොරතුරු කාර්යක්ෂමව ලබාදීම සිදු කරයි.

❖ Cadre Management Information System (CMIS)



කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (MSD) මධ්‍යම රජය, පළාත් රාජ්‍ය සේවය සහ රාජ්‍ය ව්‍යවසාය (SOEs) ඇතුළු රජයේ නිලධාරීන්ගේ තනතුරු වලට අදාල තොරතුරු ක්‍රමවත්ව කළමනාකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා මෘදුකාංග පද්ධතියක අවශ්‍යතාවය ඉදිරිපත් කළ අතර, මෙහි විෂය පථය ගැඹුරින් විශ්ලේෂණය කිරීමෙන් පසුව, මේ සඳහා නිර්මාණය කිරීමට යෝජනා වූ CMIS පද්ධතියේ පළමු අදියර ලෙස Approved Cadre මොඩියුලය සාර්ථකව ක්‍රියාවට නැංවිය.දැනට අනුමත කර ඇති තනතුරු වලට අදාලව යාවත්කාලීන කරන ලද දත්ත නව පද්ධතියට උඩුගත කිරීම සඳහා මෙම අදියරේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර ඇත. එමඟින් Excel මත පදනම් වූ ලේඛණ ක්‍රමය ඉවත් කර දත්ත නිවැරදි කිරීම, ගැටළු හඳුනා ගැනීම සහ අවසරලත් නිලධාරීන් විසින් එම දත්ත යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාදීමෙන් පසුව නිවැරදි දත්ත කාලීනව පද්ධතියට ඇතුලත් කිරීම සිදු කරයි.මෙම මොඩියුලය ක්‍රියාවට නැංවීමත් සමඟ, නවතම අනුමත තනතුරු වලට අදාළ තොරතුරු සඳහා කාලීනව ප්‍රවේශ විය හැකි අතර එම දත්ත, පද්ධතිය හරහා කළමනාකරණය කිරීමේ හැකියාව ලබා දී ඇත.

❖ Audit Management System (AuditXpert)



කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව (DMA), **AuditXpert** නම් විගණන කළමනාකරණ පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා ඉල්ලීමක් ඉදිරිපත් කල අතර අදාල නිලධාරීන් සමඟ ව්‍යාපෘතිය පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කර, පද්ධතියේ ක්‍රියාවලීන්, අධ්‍යයනය කිරීම ආරම්භ කරන ලදි. **AuditXpert** පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුළින් විගණන සැලසුම් හා මෙහෙයුම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම, අනුකූලතාව නිරීක්ෂණය වැඩිදියුණු කිරීම සහ රාජ්‍ය ආයතන තුළ වගවීම සවිමත් කිරීම අපේක්ෂිතය. මෙම පද්ධතිය මඟින් විගණන නිරීක්ෂණය කාර්යක්ෂම කරමින්, විගණන සොයාගැනීම් ලේඛනගත කිරීම සහ එම ක්‍රියාවලීන් කාලෝචිත, ප්‍රමාණවත් හා නිවැරදි ලෙස ක්‍රියාවට නැංවීම පහසු කරවීම මගින් පාලනය සහ මූල්‍ය අධීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් බලාත්මක කිරීම අපේක්ෂා කරයි.

❖ Retirement Vehicle Permit Issuance System

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව (TIPD) සතු වාහන බලපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියේ යාවත්කාලීන කිරීමක් ලෙස විශ්‍රාමික වාහන බලපත්‍ර නිකුත් කිරීම සඳහා නව මොඩියුලයක් නිර්මාණය කර දෙන ලෙස කරන ලද ඉල්ලීමකට අනුව, විශ්වාසදායක සහ කාර්යක්ෂම විසඳුමක් ලෙස විශේෂිත මොඩියුලයක් නිර්මාණය කිරීමේ අධ්‍යයනය ආරම්භ කරන ලදී. මෙම නවීකරණය ඔස්සේ විශ්‍රාමික වාහන බලපත්‍ර ඉල්ලීම් කළමනාකරණය කිරීම වඩාත් සංවිධානාත්මක සහ භාවිතයට පහසු ආකාරයට කිරීම අපේක්ෂිත අතර, බලපත්‍ර නිකුත් කිරීමේ කාලසීමාව අවම කරමින් බලපත්‍ර ඉල්ලුම් කිරීමේ ක්‍රියාවලියේ පරිපාලන කටයුතු කාර්යක්ෂම කිරීම අරමුණු කරයි. එමෙන්ම අනවසර ප්‍රවේශය වැළැක්වීම තුළින් පද්ධතියේ ආරක්ෂාව වැඩි වන අතර, බලපත්‍ර ඉල්ලීම් නිරීක්ෂණය කිරීම සහ අනුමත කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම මඟින් විශ්‍රාමික වාහන බලපත්‍ර හිමි නිලධාරීන්ට එම බලපත්‍ර ඉල්ලුම් කිරීම පහසු කරවීම ප්‍රධාන අරමුණු අතර වේ.

2.1.3 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහය සහ මුලපිරීම්



❖ **Veeam උපස්ථ පද්ධතිය හා SQL Always-On ප්‍රතිවලිත පද්ධතිය ක්‍රියාත්මක කිරීම**


මුදල් අමාත්‍යාංශයේ ITMIS ඇතුළු අනෙකුත් තොරතුරු පද්ධති සඳහා අවශ්‍ය උපස්ථ පද්ධතීන් ක්‍රියාත්මක කිරීම පසුගිය වර්ෂය තුළදී සාර්ථකව සිදු කරන ලදි. එම තොරතුරු පද්ධතිවල සමරික්තතාව හා විශ්වාසනීයත්වය තහවුරු කිරීම සඳහා දත්ත මධ්‍යස්ථානයේ, ජාල මෙහෙයුම් මධ්‍යස්ථානයේ හා දත්ත ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ මෙම උපස්ථ පද්ධති පිහිටුවන ලදි.

❖ **නව ගිනිපවුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම**

පෙර පැවති ගිනිපවුරු පද්ධතියේ සහාය ලබා දෙන කාල සීමාව අවසන් වූ බැවින් එම ගිනිපවුරු පද්ධතිය වෙනුවට නව පද්ධතියක් ස්ථාපිත කරන ලදි. එමඟින් මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ යටිතල ව්‍යුහයේ ආරක්ෂාව සහ විශ්වාසනීයත්වය ශක්තිමත් කරන ලද අතර පෙර යෙදූ සියලුම නීති නව පද්ධතියට අතුළත් කරන ලදි. පද්ධතියේ ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම සඳහා පරිශීලක පිළිගැනීමේ පරීක්ෂාව (UAT) පවත්වන ලදි. පවතින බලපත්‍රය අලුත් කිරීමට වඩා නව පද්ධතියක් යෙදවීම වඩාත් ශක්‍ය බව මූල්‍ය මෙහෙයුම් සහ තාක්ෂණික අංශ ආවරණය වන පරිදි සවිස්තරාත්මක ශක්‍යතා විශ්ලේෂණයකින් නිගමනය කරන ලද අතර ඒ අනුව මෙම පද්ධති යාවත්කාලීනයන් සිදු කරන ලදි.

❖ බාධාවකින් තොරව මෙහෙයුම් සඳහා දෘඩාංග ගැටළු විසඳීම


මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු තුළ ඇති දෘඩාංග දෝෂ නිරාකරණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. මෙහිදී තාක්ෂණික ගැටළු හඳුනා ගැනීම, කාර්යයන් අධීක්ෂණය හා පවත්වා ගැනීම වැනි වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. තවද ITMD මගින්, පරිගණක, මුද්‍රණ යන්ත්‍ර, ස්කෑනර්, ප්‍රතිලේඛ යන්ත්‍ර, ප්‍රොජෙක්ටර්, ජාල සබඳතා, විද්‍යුත් තැපැල් පිවිසුම් සහ මෘදුකාංග යෙදුම් ආශ්‍රිත ගැටළු විනිශ්චය කර විසඳීම සඳහාද වැදගත් මෙහෙයක් ඉටු කරනු ලබයි. එමෙන්ම, පරිශීලක පිවිසුම් කළමනාකරණය, මුරපද නැවත පිහිටුවීම, දත්ත උපස්ථ කිරීම, ආරක්ෂක යාවත්කාලීන සහ වෛරස් ආරක්ෂාව කළමනාකරණය කිරීම තුළින් පද්ධති අඛණ්ඩතාවය පවත්වා ගැනීම සඳහාද කටයුතු කරනු ලබයි. සාරාංශ වාර්තාවලට අනුව, වාර්තා වූ ගැටළු සැලකිය යුතු සංඛ්‍යාවක් මුද්‍රණ යන්ත්‍ර, ස්කෑනර්, ඡායා පිටපත් යන්ත්‍ර සහ ප්‍රොජෙක්ටර් ආශ්‍රිත ගැටළු සහ පරිගණක සහ දෘඩාංග නිවැරදි කිරීම් සමඟ සම්බන්ධ වේ. තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අදාල දෘඩාංග දෝෂ සහ තාක්ෂණික ගැටළු ඉක්මණින් විසඳීමෙන්, නිලධාරීන්ගේ කාලය අපතේ යාම අවම කර කාර්යක්ෂමතාව වැඩි කරනු ලබයි. තවද මූල්‍ය ක්‍රියාවලීන්, සන්නිවේදනය සහ තීරණාත්මක මෙහෙයුම් බාධාවකින් තොරව ක්‍රියාත්මක වන බව සහතික කරයි. පහත ප්‍රස්තාරය 2024.01.01 සිට 2024.12.31 දක්වා විවිධ කාණ්ඩයන්හි විසඳූ ගැටළු වල වාර්ෂික ව්‍යාප්තිය දෘශ්‍යමානව නිරූපණය කරයි.



මූලාශ්‍රය: ITMD Help Desk තොරතුරු

❖ ප්‍රශස්ථ කාර්යසාධනය සඳහා පුළුල් පරිගණක සමීක්ෂණය

2024 අගෝස්තු සිට දෙසැම්බර් දක්වා, තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු පුරා පුළුල් පරිගණක (PC) සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණයේ අරමුණ වූයේ සියලුම ඩෙස්ක්ටොප් පරිගණක, All in One පරිගණක සහ ලැප්ටොප් පරිගණක හඳුනා ගැනීම හා ස්ථාපිත මෙහෙයුම් පද්ධති පිළිබඳ විස්තර සහ පරිගණක ආරක්ෂණයේ තත්ත්වය වාර්තා කිරීමයි. මෙම මූලපිරීම වත්මන් තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමට, නිසි නඩත්තුව, ආරක්ෂක යාවත්කාලීන කිරීම් සහ කාර්යක්ෂම සම්පත් වෙන් කිරීම සහතික කිරීමට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට උපකාරී වේ. දෙපාර්තමේන්තු අනුව පරිගණක ව්‍යාප්තිය පහත ප්‍රස්තාරය මගින් නිරූපණය වේ.



මූලාශ්‍රය :- තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව - පරිගණක සමීක්ෂණය 2024

❖ LGN Wi-Fi ජාලය විස්තාරණය

LGN Wi-Fi ජාලය, මහා භණ්ඩාගාර පරිශ්‍රය තුල Wi-Fi ප්‍රවේශ ස්ථාන (Access Points) 13ක් මඟින් ක්‍රියාත්මක වෙමින් පැවති බැවින් පරිශ්‍රය තුල LGN Wi-Fi ජාල ආවරණය සීමා සහිත වී තිබීම හේතුවෙන් මෙම ආවරණ කලාපය පුළුල් කිරීම සඳහා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදී. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (ICTA) සමඟ එක්ව, නව භාණ්ඩාගාර ගොඩනැගිල්ලද ඇතුළත් කරමින්, ආවරණය උපරිම කිරීමට හැකි වන සම්පූර්ණ ජාල විස්තාරණ සැලැස්මක් සංවර්ධනය කරන ලදී. නව Wi-Fi ප්‍රවේශ ස්ථාන 59ක් සවිකර LGN Wi-Fi ජාලය විස්තාරණය කිරීමට සැලසුම් කරන ලද අතර මෙම යාවත්කාලීන කිරීම හරහා භාණ්ඩාගාර පරිශ්‍රය තුළ අඛණ්ඩ සබඳතාවයක් සහතික කරමින් සන්නිවේදන කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමට බලාපොරොත්තු වේ.

❖ ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය (SLCERT) සමඟ සම්බන්ධීකරණයෙන් KPMG මඟින් ආරක්ෂක තක්සේරුවක් සිදු කිරීම

SLCERT හි කළමනාකාරිත්වය සහ මගපෙන්වීම යටතේ KPMG ආයතනය විසින් පරිපූර්ණ ආරක්ෂක තක්සේරුවක් පවත්වන ලද අතර එමඟින් පද්ධති ආරක්ෂණ යටිතල පහසුකම් සහ මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ මෙහෙයුම් අංශ ආවරණය කරන ලදී. සමාලෝචනයෙන් පසුව, KPMG ආයතනය සිය වාර්තාව දැනට අවසන් ඇගයීමට ලක්කර ඇති අතර එය ඔවුන් විසින් SLCERT ආයතනය වෙත ඉදිරිපත් කර ඇත.

❖ e-GP පද්ධතිය සංවර්ධනයට, ස්වාධීන ඇගයුම්කරුවෙක් (Independent Evaluator) පත්කරගැනීමට සහ Cloud Based Hosting සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දීම





e-Government Procurement (e-GP) තොරතුරු පද්ධතියේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා ස්වාධීන ඇගයුම්කරුවෙක් පත්කරගැනීමට සහ Cloud Based Hosting සඳහා අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දුන් අතර එම පද්ධතියේ මෘදුකාංග අවශ්‍යතා පිරිවිතර ලේඛනය සකස් කිරීමට අවශ්‍ය සහාය රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව හා අනෙකුත් පාර්ශ්වකරුවන් වෙත ලබා දෙන ලදී. ඊට අමතරව එම පද්ධතියේ ප්‍රශස්ත කාර්යසාධනය සහ ආරක්ෂාව සහතික කිරීමට අවශ්‍ය විශේෂඥ තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදී.

2.1.4 ධාරිතා සංවර්ධනය - Friday Forum

තාක්ෂණික මගපෙන්වීම අවශ්‍ය ආයතනවලට, අත්‍යාවශ්‍ය තාක්ෂණික සහාය සහ උපදේශන සේවා, ITMD විසින් සපයනු ලබයි. එසේ සේවාවන් ලබා දීමේදී ඉහළම ප්‍රමිතිය තහවුරු කිරීම සඳහා, තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නවතම සංවර්ධනයන් සහ ප්‍රවණතාවන් පිළිබඳව යාවත්කාලීන වී සිටීම අත්‍යවශ්‍ය වේ. තොරතුරු තාක්ෂණය සීඝ්‍රයෙන් වෙනස් වන හෙයින් තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ දැනුම නවීන තාක්ෂණයෙන් සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ වර්ධනයන් සමඟ යාවත්කාලීන වී පැවතීම සේවා සැපයීමට ඉතා වැදගත් වේ.

ITMD, එහි නිලධාරීන්ගේ තොරතුරු තාක්ෂණ දැනුම වැඩි දියුණු කිරීම සඳහා "Friday Forum" වැඩසටහන, න්‍යායාත්මක දැනුම පමණක් නොව ප්‍රායෝගික දැනුමෙන් ද සන්නද්ධ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ නියැළි වෘත්තිකයින්ගේ සහයෙන් ආරම්භ කරන ලදි. මෙම වැඩසටහන මහා භාණ්ඩාගාර නිලධාරීන් මෙන්ම අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් ද ඇතුළත් වන පරිදි ව්‍යාප්ත වී ඇති අතර, එමගින් නවතම තාක්ෂණයන් සහ වෙළඳපොල ප්‍රවණතාවන් රාජ්‍ය නිළධාරීන් වෙත හඳුන්වා දීම අරමුණු කොට ඇත. විවිධ පාර්ශ්වයන්ගේ සහ තොරතුරු තාක්ෂණ වෘත්තිකයින්ගේ සහාය ඇතිව පවත්වනු ලබන මෙම වැඩසටහන මඟින් ITMD නිලධාරීන්/රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම සහ යාවත්කාලීන කිරීම Physically සහ මාර්ගගතව (online) සිදු කරනු ලබයි.



2024 වර්ෂයේදී පවත්වන ලද වැඩසටහන්

	වැඩසටහනේ නම	සහභාගි වූ නිලධාරීන් ප්‍රමාණය
01	රාජ්‍ය ඩිජිටල්කරණය හා කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ අපේක්ෂාවෙන් තොරතුරු තාක්ෂණය සම්බන්ධ යටිතල පහසුකම් සහ යෙදුම් වේදිකාවක් (Application Platform) ගොඩනැංවීම	15
02	Agile Integration Platform	72
03	මුදල් අමාත්‍යාංශය තුළ සන්නිවේදන සහ ආරක්ෂණ යටිතල පහසුකම් ඉහළ නැංවීම	32
04	Cloud Computing	19
05	ව්‍යාපෘති කළමනාකරණ මෙවලම්	10
06	නවීන යෙදුම් අවශ්‍යතා (Modern Application Needs) සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්	112
07	“ව්‍යාපෘති කළමනාකරණය සුළු පරිමාණයෙන් ආරම්භ කර ඉහළට ගෙන යන්නේ කෙසේද?” පුහුණු වැඩසටහන	95
08	ඩිජිටල් අවශ්‍යතා: Cloud Services සහ සයිබර් ආරක්ෂණය	145
09	5G & IOT හඳුන්වාදීමේ පුහුණු වැඩසටහන	65
10	“Secure and Productive Collaboration with Google” වැඩසටහන	12
11	සයිබර් ආරක්ෂණ ක්‍රම සහ එහි තර්ජන අවබෝධ කරගැනීමේ ප්‍රතිලාභ	30
12	“දත්ත ආරක්ෂණ පනත” පිළිබඳ සැසිය	158
13	පුද්ගලයින් සම්බන්ධ කිරීම තුළින් ඩිජිටල් පරිවර්තනය සක්‍රීය කිරීම	98
14	පරිගණක දෘඩාංග පිළිබඳ මූලික හැඳින්වීම	23
15	මූලික Excel වැඩසටහන	174
16	Work Smarter With Google Productivity Tools – Part 1	170
17	“කාර්යාල කළමනාකරණය” පිළිබඳ පුහුණු වැඩසටහන	22
18	Work Smarter with Google Productivity Tools – Part 2	53
19	“අපගේ ඩිජිටල් සේවා ස්ථානය ආරක්ෂා කිරීම” පිලිබඳ පුහුණු වැඩසටහන	55
20	Advanced Excel Training – Part 1	52
21	Advanced Excel Training – Part 2	118

2.2 අනාගත ක්‍රියාකාරකම්

මුදල් අමාත්‍යාංශයේ ඩිජිටල් ක්‍රියාකාරකම් ඉටු කිරීමේ ප්‍රශස්ථ වාතාවරණයක් ඇති කිරීම සඳහා අනාගතයේදී පහත සඳහන් කාර්යයන් ඉටු කිරීමට දෙපාර්තමේන්තුව සැලසුම් කර ඇත.

❖ Cloud ඉ-තැපල් විසඳුමක් ක්‍රියාත්මක කිරීම

Proof of Concept (POC) මඟින් භාවිතා කිරීමේ පවතින ගැටළු පිළිබඳව ගැඹුරින් සමාලෝචනය සහ පරීශීලකයන්ගේ ප්‍රතිචාර ලබා ගැනීමෙන් පසුව, ශක්තිමත් **Cloud** ඉ-තැපැල් විසඳුමක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරමින් පවතී. නවීන ඩිජිටල් පරිවර්තන උපාය මාර්ගයන්ට අනුකූල වන පරිදි සන්නිවේදන කාර්යක්ෂමතාව, ආරක්ෂාව සහ ප්‍රවේශතාව වැඩි දියුණු කිරීම මෙහි අරමුණයි.


❖ AuditXpert පද්ධතිය

2025 වසරේදී AuditXpert පද්ධතිය සංවර්ධනය අවසන් කර එය ජාතික මට්ටමින් සියලුම රජයේ ආයතනයන්හි ක්‍රියාත්මක කිරීමට අරමුණු කර ඇත. මෙම පද්ධතිය මඟින් විගණන සැලසුම් සැකසීම සහ විගණන විමසුම් නිරීක්ෂණය පහසු කිරීමට නිර්මාණය කර ඇති අතර, විගණන මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ ප්‍රගතිශීලීතාවය වැඩි දියුණු කරමින් රජයේ පුළුල් ඩිජිටල්කරණයට දැඩි දායකත්වයක් ලබාදෙමින් විනිවිදභාවය සහ වගකීම් සහගත බව තහවුරු කරනු ලබයි.

❖ NFAMS පද්ධතියෙහි Structure Assets Module සංවර්ධනය ආරම්භ කිරීම

දැනට ක්‍රියාත්මක Non-Financial Asset Management System (NFAMS) පද්ධතියේ Vehicle Asset Module සඳහා ඉදිරිපත් කරන ලද සියලුම වෙනස්කම් සඳහා වූ ඉල්ලීම් (Change Requests) සම්පූර්ණ කිරීමෙන් සහ එම මොඩියුලය කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මඟින් නිල වශයෙන් පිළිගැනීමෙන් පසු, Structure මොඩියුලය සංවර්ධනය කිරීමේ කටයුතු සැලසුම් කර ඇත.

❖ තොරතුරු තාක්ෂණික හදිසි තත්වයන් සඳහා ප්‍රතිචාර සැලැස්ම (Incident Response Plan)



ආරක්ෂාව සහ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා, මුදල් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ පද්ධති, දත්ත සහ යටිතල පහසුකම් වල හදිසි තත්ත්වයන් සඳහා ප්‍රතිචාර සැලැස්ම සකස් කිරීමට සැලසුම් කර ඇත. අවදානම් හා හදිසි තත්ත්ව වලදී ඇතිවන බලපෑම් අවම කිරීම සහ කඩිනමින් ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රවේශයක් ස්ථාපිත කිරීම මෙහි අරමුණයි.

- **2024 අංක 44 දරණ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ පැවරී ඇති කාර්යයන් සහ වගකීම් ක්‍රියාත්මක කිරීම**

  රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව, එම පනතේ නිශ්චිතව දක්වා ඇති කර්තව්‍ය සහ මහා භාණ්ඩාගාරයේ කර්තව්‍ය කරගෙන යෑම සඳහා සඵලදායී පරිගණක පද්ධතියක්/ පද්ධති සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණය සඳහා ද එම පද්ධතියේ/ පද්ධතීන්ගේ කාර්යසාධනය, ආරක්ෂාව ආදී කරුණු පිළිබඳ අඛණ්ඩ අධීක්ෂණය සඳහා ද ක්‍රමවේද ස්ථාපිත කිරීමට තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය රෙගුලාසි සකස් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. ඊට අමතරව පනතේ විධිවිධාන අනුව ප්‍රකාශයට පත් කළ යුතු මූල්‍ය ප්‍රකාශ, වාර්තා හා නියෝග මුදල් අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පල කිරීම සඳහා පහසුකම් සැපයීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ඇත.

- **නිලධාරීනගේ ධාරිතා සංවර්ධනය**

  ITMD කාර්ය මණ්ඩලයේ සහ භාණ්ඩාගාර නිලධාරීන්ගේ තොරතුරු හා සන්නිවේදනයට අදාල කුසලතා ඉහළ නැංවීමට සහ වැඩි දියුණු කිරීම සඳහා දේශන, වෙබිනාර් සැසි, ක්ෂේත්‍ර චාරිකා, ප්‍රායෝගික වැඩමුළු ආදිය ඇතුලත් අඛණ්ඩ ඉගෙනුම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම

කේ. රවින්ද්‍ර පත්මප්‍රිය
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

.....

කේ. රවින්ද්‍ර පත්මප්‍රිය

අධ්‍යක්ෂ ජනරාල්

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

එස්ඒ-එ

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024		සටහන	තත්‍ය 2024	තත්‍ය 2023	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	එස්ඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		1,134,871,000	440,555,000	එස්ඒ-3
-	තැන්පතු		1,879,126	11,641,679	එස්ඒ-4
-	අත්තිකාරම් ගිණුම්		3,626,998	3,187,454	එස්ඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		2,515,420	1,972,131	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,142,892,544**	**457,356,264**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,142,892,544**	**457,356,264**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		546,202	5,071	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		1,142,346,341	457,351,193	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
53,250,600	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	53,226,906	41,399,909	
1,073,880,237	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	1,073,880,237	387,865,296	එස්ඒ-2(ii)
460,016	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	460,016	417,778	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
1,127,590,853	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**1,127,567,160**	**429,682,984**	
	මූලධන වියදම්				
5,577,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	4,478,519	-	
7,278,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	4,035,017	8,844,837	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	එස්ඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,000,000	හැකියා වර්ධනය	14	817,950	486,250	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
13,855,000	**මුළු මූලධන වියදම් (උ)**		**9,331,486**	**9,331,087**	
	තැන්පතු ගෙවීම්		1,328,981	11,955,675	එස්ඒ-4
	අත්තිකාරම් ගෙවීම්		4,324,016	2,966,596	එස්ඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**5,652,997**	**14,922,271**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**1,142,551,643**	**453,936,342**	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(205,301)**	**3,414,851**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		**(205,301)**	**3,414,851**	එස්ඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	එස්ඒ-3

ඒසිඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය	
		2024	2023
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	55,476,826	53,829,391
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	7,242,815	6,545,797
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**62,719,641**	**60,375,188**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		6,287,949	6,141,076
දේපළ පිරියත හා උපකරණ සංචිතය		55,476,826	53,829,391
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	954,866	404,721
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**62,719,641**	**60,375,188**

පිටු අංක 07 සිට 22 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 23 සිට 28 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම :	නම :	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර :	තනතුර :	නම :
	දිනය : 26/08/2025	දිනය : 26/08/2025

කේ.එම්.මහින්ද සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

කේ. රවීන්ද්‍ර පත්මේන්ද්‍රිය
අධ්‍යක්ෂ ජනරාල්
තොරතුරු තාක්ෂණ සළමුනාකරණ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

ඩී. පී. ගුණසේන්ද්‍ර ප්‍රදීප්
අධ්‍යක්ෂ (මුදල්)
තොරතුරු තාක්ෂණ සළමුනාකරණ දෙපාර්තමේන්තුව
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
මහලේකම් කාර්යාලය, කොළඹ 01.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	නත්‍ය	
	2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	2,515,420	1,972,131
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	
අග්‍රිම ලැබීම්	1,134,871,000	440,555,000
අත්තිකාරම් අයකර ගැනීම්	3,928,680	4,457,102
තැන්පතු ලැබීම්	1,879,126	11,641,679
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,143,194,226**	**458,625,912**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,126,941,494	429,117,831
සහනාධාර සහ මාරුකිරීම්	460,016	417,778
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	262,031	4,477,627
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	546,202	5,071
අත්තිකාරම් ගෙවීම්	4,324,016	3,320,843
තැන්පතු ගෙවීම්	1,328,981	11,955,674
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,133,862,740**	**449,294,824**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**9,331,486**	**9,331,087**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	9,331,486	9,331,087
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**9,331,486**	**9,331,087**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(9,331,486)**	**(9,331,087)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**0**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

*යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
		අදාල නොවේ			

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම *	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසන් ප්‍රතිපාදනය		
පුනරාවර්තන	1,132,435	1,134,934	1,127,567	99.35
ප්‍රාග්ධන	8,000	13,855	9,331	67.34

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
			අදාල නොවේ			

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්				
9152	යන්ත්‍රෝපකරණ	52,810	52,810	-	100
9153	ඉඩම්				
9154	අස්පෘශ්‍ය වත්කම්	2,667	2,667	-	100
9155	ජීව විද්‍යාත්මක වත්කම්				
9160	කෙරීගෙන යන වැඩ				
9180	බදු දෙන ලද වත්කම්				

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

විගණකාධිපති විසින් නිකුත් කරනු ලැබූ 2024 දෙසැම්බර් 31 වන දිනට නියමිත අවසන් විගණන වාර්තාව ඇමුණුම 01 හි අමුණා ඇත.

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

	විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
		100% - 90%	75%-89%	50%-74%
1	මුදල් අමාත්‍යාංශයේ පරිශ්‍රය තුළ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් යාවත්කාලීන කිරීම, නඩත්තු කිරීම හා අධීක්ෂණය කිරීම	100		
2	මුදල් අමාත්‍යාංශයේ දෘඪාංග නඩත්තුව	100		
3	නව වැටුප් ගෙවීමේ පද්ධතියේ යටිතල පහසුකම් කළමනාකරණය	100		
4	MoF වෙබ් ද්වාරයේ අන්තර්ගත යාවත්කාලීන කිරීම	100		
5	MoF වෙබ් ද්වාරය සඳහා වැඩි දියුණු කිරීම් කිරීම	100		
6	භාණ්ඩාගාර අන්ත : ජාලය අධීක්ෂණය සහ නඩත්තු කිරීම	100		
7	කාර්යක්ෂම නිල සන්නිවේදනය සඳහා විද්‍යුත් තැපැල් පද්ධතිය (Outlook) සම්බන්ධීකරණය කිරීම	100		
8	පද්ධති සංවර්ධනය/ පද්ධති ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම	100		
9	නිලධාරීන්ට සහ අභ්‍යාසලාභී පුහුණුවන්නන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම/ කළමනාකරණය කිරීම	100		

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	**50%-74%**	**75%- 100%**
08. සියල්ල ඇතුලත් සහ තිරසාර ආර්ථික වර්ධනය, පූර්ණ හා ඵලදායි රැකියා නියුක්තිය සහ සැමට මනා කාර්ය භාරයක් ප්‍රවර්ධනය කිරීම	නවීන ක්‍රමවේද තොරතුරු තාක්ෂණ සන්නිවේදන භාවිතා කරමින් එක් එක් දෙපාර්තමේන්තුවේ ස්වයංක්‍රිය පද්ධති සහ කාර්ය	පද්ධති සංවර්ධනය කිරීම			100%
		අභ්‍යන්තර තැපැල් පද්ධතිය ප්‍රවර්ධනය (Outlook)			100%
	භාණ්ඩාගාරයේ ආර්ථික, මූල්‍ය, ආයතනික යනාදී තොරතුරු පහසුවෙන් රාජ්‍ය ආයතනවලට හා පොදු මහජනතාවට ලබා ගැනීමට ඉඩ ප්‍රස්ථා සැලසීම	මහා භාණ්ඩාගාර වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම			100%
09. නවමු යටිතල පහසුකම් ගොඩනැංවීම, සියල්ල ඇතුළත් තිරසාර කාර්මීකරණය සහ නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීම	ඉ රාජ්‍ය අරමුණු සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් දෙපාර්තමේන්තු වල තොරතුරු තාක්ෂණික ක්‍රියාවන් සම්බන්ධීකරණය	යටිතල පහසුකම් නඩත්තුව			100%
		තොරතුරු තාක්ෂණ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම			100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

මහා භාණ්ඩාගාරයේ/මුදල් අමාත්‍යාංශයේ දෙපාර්තමේන්තු වල ස්වයංක්‍රීයකරණ කටයුතු සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව වගකීම දරයි. ඒ අනුව, 2024 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුව විසින් ඉහත 5.1 ඡේදයේ හඳුනාගෙන ඇති තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සාක්ෂාත් කර ගැනීම සඳහා සිදු කරන ලද ක්‍රියාකාරකම් කිහිපයක් පහත දක්වා ඇත.

- ගුණාත්මක, ඵලදායී සහ කාර්යක්ෂම සන්නිවේදන පද්ධතියක් සහතික කිරීම සඳහා මුදල් අමාත්‍යාංශයේ ජාල යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම සහ අඛණ්ඩව අධීක්ෂණය කිරීම
- උපස්ථ, ප්‍රතිවලිත හා ගිනිපවුරු පද්ධති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය මඟින් අදාල තොරතුරු පද්ධතිවල අඛණ්ඩ ක්‍රියාකාරීත්වය තහවුරු කරමින් අමාත්‍යාංශයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම. ආරක්ෂක තක්සේරු කිරීම් සහ තර්ජන ඇගයීම් පැවැත්වීම මඟින් සයිබර් තර්ජන අවම කිරීමට අවශ්‍ය ආරක්ෂාව සහතික කිරීම
- මියගිය රජයේ නිලධාරීන්ගේ පවුල්වලට, සියලුම රාජ්‍ය ආයතනවලට සහ රාජ්‍ය බැංකුවලට ඇපකරණය අරමුදල යටතේ ණය පියවීමේ ඉල්ලීම් ආශ්‍රිත තත්ත්වය නිරීක්ෂණය කිරීමේ හැකියාව සහිත Gurantee Fund Loan Settlement Monitoring System (GFLSMS) සංවර්ධනය කිරීම
- රජයේ නිලධාරීන්ගේ වත්මන් අනුමත තනතුරු විස්තරයන්, තනතුරු කළමනාකරණ තොරතුරු පද්ධතිය (**CMIS)** වෙත උඩුගත කිරීමේ සංවර්ධනය, අනුමත තනතුරු විස්තර යාවත්කාලීන කිරීම ඇතුළත්ව, පද්ධතියේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කරනු ලැබීය
- යහපාලනය වැඩිදියුණු කිරීම, දූෂණ අවදානම් අවම කිරීම සහ සාධාරණ තරඟකාරීත්වය සහතික කිරීම උදෙසා ප්‍රසම්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා e-GP මඟින් පුද්ගල මැදිහත් වීම් අඩු කිරීම
- අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි නව සංවර්ධනයන් සිදු කරන ලද අතර, මහජන /පුද්ගලික ආයතන සහ පොදු ජනතාව සමඟ නිසි සන්නිවේදනය සහ අන්තර් ක්‍රියාකාරීත්වය සඳහා වන ද්වාරය යාවත්කාලීන කිරීම
- භාණ්ඩාගාර දෙපාර්තමේන්තු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථකව පැවැත්වීම

තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී දෙපාර්තමේන්තුව පහත අභියෝගවලට මුහුණ දී ඇත.

- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල වේගවත් තාක්ෂණික පරිවර්තනයට අනුගත වීමේ දුෂ්කරතාවය සහ පිරිවැය වැඩිවීම
- පොදු රජයේ විද්‍යුත් තැපැල් වේදිකාව, පද්ධති සත්කාරකත්වය සහ ජාතික දත්ත මධ්‍යස්ථානය වැනි ක්ෂේත්‍ර සඳහා ජාතික මට්ටමේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති, මාර්ගෝපදේශ නොමැති වීම
- ආයතනික හා තාක්ෂණික වෙනස්කම්වලට සේවක ප්‍රතිරෝධය ජයගැනීමට හැකි වන පරිදි ඩිජිටල් පරිවර්තනය ක්‍රමානුකූලව සිදු කිරීම

මානව සම්පත් පැතිකඩ

6.1 2024.12.31 දිනට සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	17	14	**03**
තෘතීයික	14	11*	**03**
ද්විතියික	34	25	**09**
ප්‍රාථමික	08	07	**01**
එකතුව	**73**	**57**	**16**

* රා.ප.ව. අංක 14/2022 අනුව එක් නිලධාරියකු වැටුප් රහිත විදේශ නිවාඩු ලබාගෙන ඇත.

6.2 ** ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් නිහය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවෙහි ප්‍රධානතම කාර්යය වන්නේ මුදල් අමාත්‍යාංශය හා එහි දෙපාර්තමේන්තු වෙත නවීන තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම හා තොරතුරු තාක්ෂණ කාර්යයන් සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීම වේ. එසේ වුවද, මේ වන විට ඩිජිටල් රාජ්‍යකරණ ප්‍රවණතා හමුවේ මුදල් අමාත්‍යාංශයෙන් පරිබාහිර රාජ්‍ය ආයතනයන්හී ද ඩිජිටල්කරණ ක්‍රියාවලියේ මූලික අදියරයන්හි අත්‍යාවශ්‍ය කාර්යයන් උදෙසා ද මෙම දෙපාර්තමේන්තු නිලධාරින්ගේ සේවය ලබා දීමට සිදුව ඇත. ඒ සඳහා තාක්ෂණික කාර්යයන්හි මනා පරිචයක් සතු කාර්ය මණ්ඩලයේ අවශ්‍යතාව අනිවාර්යය වේ.

එම කාර්යභාරය ඵලදායීව ඉටු කර ගැනීම උදෙසා පවත්නා සිමිත කාර්ය මණ්ඩලය කළමනාකරණය කර ගැනීමට දෙපාර්තමේන්තුව සමත් වූ අතර පුරප්පාඩුව පැවති තොරතුරු තාක්ෂණික සහකාර තනතුරු නවය (09) සඳහා නවක නිලධාරින් පස් දෙනෙකු (05) අනුයුක්ත කර ගැනීමට ද ප්‍රායෝගික පුහුණුව සඳහා උසස් අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතනවලින් බඳවා ගනු ලබන අභ්‍යාසලාභීන්ගේද සහාය ලබා ගැනීමටද දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

ඒ අනුව, මෙලෙස සංවිධිත කරනු ලැබූ මානව සම්පත මඟින් දෙපාර්තමේන්තුව සිය කාර්යයන් ඵලදායීව කාර්යක්ෂමව ඉටු කරන ලදී.

6.3 මානව සම්පත් සංවර්ධනය

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	Cloud තාක්ෂණ පුහුණු වැඩසටහන (ICT අංශයේ ප්‍රවණතා, ඊළඟ පරම්පරාවේ Datacom විසඳුම්, බුද්ධිමත් DC විසඳුම්, Cloud තාක්ෂණය සහ අනාගතය)	40	දින 02	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
2	ගිනිපවුර පරිපාලන පුහුණුව	12	දින 02	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
3	CCNA පුහුණු වැඩසටහන	12	දින 03	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
4	ඩයලොග් ව්‍යාවසාය දිනය – 2024	16	දින 02	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
5	තාක්ෂණික සාකච්ඡා/ Cloud තාක්ෂණ ගවේෂණය - Native Virtualization	04	දින 01	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
6	තොරතුරු ආරක්ෂක සංසදය	04	දින 01	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
7	රාජ්‍ය අංශයේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා Cloud Service පිළිබඳ වැඩමුළුව	05	දින 01	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
8	තොරතුරු තාක්ෂණ සමුළුව	14	දින 02	210,000	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
9	'සයිබර් ආරක්ෂණය පිළිබඳ සහතික කළ' වැඩසටහන (ISC2).	02	දින 02	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
10	මයික්‍රොසොෆ්ට් Cloud (MS-900, AI-900, MS-102, MD-102, AZ - 500) වැඩසටහන	03	මාස 01	210,000	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
11	සිස්කෝ සහතික කළ ජාල සංගමයේ (CCNA) අධ්‍යාපනික විෂය මාලාව	02	පැය 210	63,000	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
12	රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය	04	පැය **210**	20,000	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
13	AI තාක්ෂණය	05	පැය 03	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
14	අයවැය රාමුව සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ අයවැයකරණය පිළිබඳ වැඩමුළුව	01	දින 03	-	-	දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
15	රජයේ වැටුප් සැකසීමේ ක්‍රමය	01	දින 03	21,000		දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
16	ගිණුම්කරණ ක්‍රමවේදය දැනුවත් කිරීම සහ අවසාන ගිණුම් පිළියෙල කිරීම	01	දින 02	13,000		දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
17	කථන කුසලතා පුහුණු වැඩසටහන	02	දින 10	70,000		දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
18	MS Excel භාවිතයෙන් පැතුරුම්පත් සකස් කිරීම	01	දින 01	7,750		දේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
19	රජයේ සන්නිවේදන වෘත්තිකයන්ගේ පෙර්මය	01	දින 03	-	-	විදේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
20	ගෝලීය සංවර්ධන මූලපිරීම් යටතේ ඩිජිටල් ආර්ථිකය සහ කර්මාන්ත ඒකාබද්ධ කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය	01	දින 14	-	-	විදේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
21	ඉහළ ගුණාත්මක ඩිජිටල් සේද මාවතක් ඒකාබද්ධව ගොඩනැඟීම සහ එක් තීරයක් එක් මාවතක් රටවල් සඳහා ගෝලීය ඩිජිටල් සහයෝගිතාවයේ නව රටාවක් ගොඩනැඟීම පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය	01	දින 07	-	-	විදේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
22	ඉන්දියානු තාක්ෂණික හා ආර්ථික සහයෝගිතාවය යටතේ ශ්‍රී ලංකාවේ දිප ව්‍යාප්ත සේවා නිලධාරීන් සඳහා වන පළමු පුහුණු වැඩසටහන (ITEC)	01	දින 14	-	-	විදේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩ සටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමවුම/ ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
23	ගෝලීය සංවර්ධන මුලපිරීම යටතේ ඩිජිටල් ආර්ථික පාලනය පිළිබඳ සම්මන්ත්‍රණය - චීනය	01	දින 14	-	-	විදේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
24	ශ්‍රී ලංකාවේ ඉ-රජයේ ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සහ දියත් කිරීම - බංග්ලාදේශය	01	දින 04	-	-	විදේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම
25	ශ්‍රී ලංකාවේ ඉ-රජයේ ප්‍රසම්පාදන (e-GP) පද්ධතිය සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සහ දියත් කිරීම - ඉන්දියාව	01	දින 04	-	-	විදේශීය	විෂය දැනුම වර්ධනය කර ගැනීම

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය නිරණ ක්‍රියාමාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ වීට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෙහෙයුම් පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සම්ක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සම්ක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්භිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අදාළ නැත		
9.2	වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අදාළ නැත		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අභාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය කිරණ ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අදාළ නැත		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අදාළ නැත		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි ඛැරකෙම්වලට ඵලදීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයෙන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	-		
15.2	රැස් කර තිබූ ආදායම්, භැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	-		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	-		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එකි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු සුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂය සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } TPD/E/DITM/FS/24/12 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 මැයි 30 දින

ගණන්දීමේ නිලධාරී
තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව

ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 329 - තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 අග්‍රිම කළමනාකරණය

2024 වර්ෂය සඳහා සැලසුම් කළ පරිදි ඉල්ලම් කළ යුතු අග්‍රිම එකතුව රු.මි. 1,164.9ක් වුවද, එකතුව රු.මි.1,575.1ක් ඉල්ලුම් කිරීමෙන් සැලසුම් කළ අග්‍රිමයට වඩා එකතුව රු.මි.410.1ක් හෙවත් සියයට 35.2ක් වැඩියෙන් ඉල්ලුම් කර තිබුණු අතර මාසිකව සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය හා මාසිකව ඉල්ලුම් කළ අග්‍රිමය අතර රු.මි.-208.1 සිට රු.මි.233.1ක් දක්වා වූ පරාසයකින් විචලනයන් පැවැතුණි. ඒ අනුව, දෙපාර්තමේන්තුව විසින් තාත්වික ලෙස අග්‍රිම ප්‍රරෝකතනය කර නොතිබුණි.

3.2 වියදම් කළමනාකරණය

(අ) සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන හා මූලධන වැය විෂයයන් 10ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් එකතුව රු.51,017,100ක් හෙවත් සියයට 0.31 සිට 145 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 ප්‍රකාරව ප්‍රතිපාදන වැඩි කර ගෙන තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයන් සිදු නොකර පරිපූරක ඇස්තමේන්තු හා මුදල් රෙගුලාසි 66/69 යටතේ එකතුව රු.5,577,000කින් ප්‍රතිපාදන සළසාගෙන තිබූ අතර එම ප්‍රතිපාදන මඟින් ගොඩනැඟිලි සහ ඉදිකිරීම් සඳහා රු.3,901,518 ක් හා වාහන අලුත් වැඩියාවක් සඳහා රු.577,000ක් ගෙවා තිබුණි.

3.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.4 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

විසර්ජන පනතින් බලය දෙනු ලැබූ උපරිම හර ශේෂ සීමාව රු.12,000,000ක් වුවත්, වර්ෂය අවසානයේදී තත්‍ය වියදමේ උපරිම හර ශේෂ සීමාව රු.6,941,134ක් වූයෙන් ළඟා නොවූ උපරිම හර ශේෂ සීමාව රු.5,058,866ක් හෙවත් සියයට 43ක් වී තිබුණි. ඒ අනුව එම ඇස්තමේන්තු තාත්වික පදනමින් පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය වේ.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු කිරීමේ ප්‍රගතිය

(අ) 2021 අගෝස්තු 22 දිනැති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව දෙපාර්තමේන්තුව විසින් සංවර්ධනය කරනු ලබන තොරතුරු පද්ධතින් 07ක් පවතින බව සඳහන් වුවද, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව එක් පද්ධතියක් (Guarantee Fund Loan Settlement Management System (TOD)) පමණක් ඇතුළත් කර තිබුණි.

(ආ) රාජ්‍ය මූල්‍ය අවකාශය පුළුල් කිරීම හා පොදු සම්පත් කළමනාකරණ පද්ධතිය කාර්යක්ෂම කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් කටයුතු ස්වයංක්‍රීය කිරීම අරමුණු කරගෙන 2010 වර්ෂයේදී ඒකාබද්ධ කළමනාකරණ තොරතුරු පද්ධතිය (ITMIS) සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කර තිබුණි. මෙම ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන

7,920කට සමාන ඇ.ඩො. මිලියන 60ක් වී තිබූ අතර 2023 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 5,647ක වියදමක් දරා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දී පද්ධතියේ, යෙදුම් මෘදුකාංග, පද්ධති මෘදුකාංග හා තොරතුරු තාක්ෂණ සහායක යටිතල පහසුකම් සැපයීම, ස්ථාපනය මෙහෙයවීම හා නඩත්තුව වෙනුවෙන් N- Able (Pvt) Ltd. සමාගම සමඟ ද සහාය සේවා හා වගකීම් කාලයෙන් පසු සේවා සැපයීම සඳහා Free Balance Inc. ආයතනය සමඟ එළඹ තිබූ ගිවිසුම් අනුව 2023/2024 වර්ෂ වෙනුවෙන් රු.මිලියන 901ක් සහ පද්ධතියෙහි අන්තර්ජාල සම්බන්ධතා ගාස්තු වෙනුවෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට 2024 වර්ෂය තුල රු.මිලියන 9.37ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. ඒ අනුව, සමාලෝචිත වර්ෂය අවසාන වන විට, දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය සඳහා එකතුව රු.මිලියන 911ක වියදමක් දරා තිබුණි. එසේ වුවද, ව්‍යාපෘතිය ආරම්භකර වසර 14 ක් ඉක්මවා තිබුණද, මෙම පද්ධතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් ක්ෂේත්‍ර 13ක් සංවර්ධනය කර අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක කිරීමට දෙපාර්තමේන්තුව මේ දක්වා අපොහොසත්වී තිබුණි.

4.1.2 ප්‍රසම්පාදනයන්

(අ) මහා භාණ්ඩාගාරයේ භාවිතාවන තොරතුරු පද්ධතින්හි මෘදුකාංග, දෘඩාංග මෙහෙයුම් සහ නඩත්තු කිරීම කිරීම සඳහා 2018 සැප්තැම්බර් 14 දින Gennext (Pvt)Ltd සමග රු.84,240,000ක ගිවිසුමකට එළඹ තිබූ අතර එහි වගකීම් කාලයෙන් පසු සේවා හා නඩත්තු පිලිබඳව කොන්ත්‍රාත් ගිවිසුමේ විධිවිධාන ඇතුළත් කර නොතිබූ අතර, විවෘත තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව පෙර කොන්ත්‍රාත්කරු වෙතම ලංසුව පිරිනමා තිබූ අතර ඒ සඳහා සාධාරණ තහවුරුවක් තාක්ෂණික ඇගයීම් කමිටුව හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ලබා දී නොතිබුණි. තවද, මේ සඳහා වසරක කාලයක් සඳහා සේවා නඩත්තු ගිවිසුමකට එළඹීමට දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමැතිය දී තිබුණ ද, විගණනය වෙත ඉදිරිපතරන ලද තොරතුරු අනුව මාස 40ක නඩත්තු කාලයකට ගිවිසුම් ගත වීම සම්බන්ධයෙන් තාක්ෂණික කමිටු නිර්දේශයක් හා ප්‍රසම්පාදන කමිටු අනුමැතියක් ලබාගෙන නොතිබූ අතර මේ සඳහා රු.46,025,492ක් ගෙවීම් සිදු කර තිබුණි.

(ආ) භාණ්ඩාගාරයෙහි පවතින ගොනු සේවාදායකය සහ විද්‍යුත් තැපැල් හුවමාරු සේවාදායකය සඳහා සේවා මට්ටමේ ගිවිසුම 2023 දෙසැම්බර් 16 සිට 2024 දෙසැම්බර් 15 දක්වා අලුත් කිරීම සඳහා, වසරකට ආසන්න කාල ප්‍රමාදයකින් පසුව, 2024 ඔක්තෝබර් 24 දින ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත Gennext (Pvt) Ltd ගිවිසුම්ගත වී තිබූ අතර ඒ අනුව වර්ෂයකට ආසන්න කාලයක් විධිමත් සේවා ගිවිසුමකින් තොරව සේවා ලබා ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. තවද, විවෘත තරඟකාරී ලංසු කැඳවීමකින් තොරව කොන්ත්‍රාත් ගිවිසුම දිර්ඝ කිරීම සඳහා සාධාරණ තහවුරුවක් තාක්ෂණික ඇගයීම් කමිටුව හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව ලබා දී නොතිබුණු අතර මේ සඳහා රු.12,516,369 ක් ගෙවීම් සිදු කර තිබුණි.

(ඇ) 2024 ප්‍රසම්පාදන සැලැස්ම අනුව ඇස්තමේන්තු වටිනාකම රු.2,000,000ක් වූ Network Switcher මිලදී ගැනීමට සැලසුම් කර තිබුණ ද විධිමත් සැලසුමකින් තොරව කටයුතු කිරීම හේතුවෙන් මෙම මිලදී ගැනීම සමාලෝචිත වර්ෂය තුළ දී සිදු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

2024 දෙසැම්බර් 31 දින වන විට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 73 න් 19ක් හෙවත් අනුමත තනතුරුවලින් සියයට 26 ක් පුරප්පාඩු වී තිබුණි. මෙහිදී, මුදල් අමාත්‍යාංශයට අයත් අනෙකුත් දෙපාර්තමේන්තු මෙන්ම අනෙකුත් රාජ්‍ය ආයතන තොරතුරු තාක්ෂණ කළමනාකරණ ප්‍රවේශයකට අනුගත කර ගැනීමේ දෙපාර්තමේන්තු අරමුණු කරා ලහාකර ගැනීමට සෘජු දායකත්වයක් ලබා දිය හැකි ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06ක්, තෘතීය මට්ටමේ තනතුරු 03ක්, ද්විතියික මට්ටමේ තනතුරු 09ක් ද මෙහි ඇතුළත්වන අතර කාලඡේදය අවසානය වනවිට පුරප්පාඩු වීමේ කාල පරාසය මාස 04ත් වසර 02 මාස 06ක් අතර වී තිබුණ ද එකී පුරප්පාඩු පිරවීම සඳහා සාධනීය පියවර ගැනීමට දෙපාර්තමේන්තුව මේ දක්වා අපොහොසත් වී තිබුණි.

ඩී.ජී.ඒ.එස්. අනුලසිරි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට